# සිනුවර හසුන



## සිඩ්නි සිට ලියමි

සමහරු තරගය කියා කියති. ලියති. තවත් සමහරු තරංගය කියා කියති. ලියති. තරගය යන්න නිවරදි බව පැවසේ. ඒ වාදය කෙසේ වෙතත් තරග නොහොත් තරඟ අපේ ජීවිත හා වෙන් කළ නොහැකි ආකාරයට බැඳී තිබෙන බව නම් සත්‍යයකි.

අප කළලයක් ලෙසින් මව් කුස පිළිසිඳ ගන්නේ ද තරගයකින් දිනූ එක් ශුක්‍රාණුවක් ඩිම්බය හා සංසේචනය වීම නිසා බව ජීව විද්‍යානුකූල මතයයි. ඒ තරගයෙන් පැරදෙන ශුක්‍රාණු ගැන කිසිවෙකු දුක් නොවෙති. එලෙස ජයග්‍රාහී ශුක්‍රාණුවකින් ඇරඹුණද, අපේ ජීවිත කාලය තුල මුහුණ පෑමට සිදුවන විවිධ තරගවලින් ජය ඉන් සහතික නොකෙරේ.

මව් කුසින් බිහිවුණු ද සිට මේ අපව මෙකී විවිධාකාර තරගවලට පුහුණු කරවණු ලැබේ. අධ්‍යාපන අංශයේ ඇති විවිධ තරග මින් ප්‍රධාන තැනක් ගනී. පන්තියේ පළමුවෙනියා වීමේ තරගය ඉන් පලමුවැන්නයි. නමුත් මෙය කුඩා කණ්ඩායමක් තුල ඇතිවෙන ඉතාමත්ම සාපේක්ෂ දෙයක් නිසා සමහර විට එහි තරගකාරී බවක් නොදැනේ. එනිසාම, මා කුඩා කල නොදැන සිටි තරගකාරී බවකට මුහුණ දෙන්නට මට උසස් පෙල විභාගයට පෙනී සිටීමේ දී මට සිදුවිය. එය ජයගැනීම මුළු ජීවිතයම ජයගත්තාක් වැනි හැඟීමක් සිතට ගෙන දුන් නිසා දෝ ඉනික්බිති මුහුණ දුන් විවිධාකාර තරගවල කිසිදු වටිනාකමක් සිතට නොහැගුණි. මීට වඩා වැඩියමක් කරන්නට තිබුණා නොවේද කියා ඇතැම් විට සිතෙන්නේ එනිසා ය.

ධනවාදී ආර්ථිකයේ ඇතැයි කියන කාර්‍යක්ෂමතාවය රැඳී ඇත්තේ ඉල්ලුම සහ සැපයුම අනුව මිළ න්‍යාය ක්‍රියාත්මක වීම මතය. මෙහිදී, වෙළඳපොලේ පූර්ණ තරගකාරීත්වය අපේක්ෂා කෙරේ. සාධාරණ වෙළඳ කොමිසම යනාදී රාජ්‍ය ආයතන පිහිටුවා ඇත්තේ මේ වෙළඳපොළ තරගකාරීත්වය හැකි ඉහල මට්ටමකින් පවත්වාගෙන යන්නට බව අපි දනිමු.

වෙළඳපොල සැපයුම සඳහා බලපාන තරගකාරීත්වය තුලින් නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්‍යක්ෂමතාවය අපේක්ෂා කරන්නාක් සේම, අධ්‍යාපන ක්ෂේත්‍රයේ තරග විභාගවලින්ද සිසුන් අතර වඩා හොඳින් ඉගෙනීමට උනන්දුවක් ඇති කොට සමස්ත අධ්‍යාපන මට්ටම ඉහල තලයකට ගෙන එනු ඇතැයි අපේක්ෂා කළ හැක.

පසුගිය දශක පහක පමණ කාලය තුල ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය ගැණ සලකා බලන විට තරගකාරීත්වයේ සාර්ථකත්වය හොඳින් පෙනේ. කලකට ඉහත සාමාන්‍ය පෙල විභාගයෙන් වැඩ හයක් සමත්වී සම්මාන තුනක් ලබා ගන්නා තැනැත්තා මහා සමතෙක් ලෙස සැලකුණි. විභාගයේ ඉතිරි විෂයයන් දෙක මුළුමණින් ම අසමත් බවත්, සම්මාන සාමාර්ථ ලැබී ඇත්තේ මුළු විෂයන්ගෙන් හරි අඩකටත් අඩු සංඛ්‍යාවකට බවත් නොසලකා හැරුණු කරුණු විය.

විෂයයන් අටටම විශිෂ්ඨ සම්මාන ලබා ගැනීම වනාහී හාවා හඳ දකින්නාක් මෙන් සිදුවන, දිණමිණ පත්‍රයේ මුල් පිටුවේ විස්තර පළවෙන ආකාරයේ ප්‍රවෘත්තියක් විය. නමුත් අසුව දශකයේ මැද භාගය වන විට විෂයයන් අටටම විශිෂ්ඨ සම්මාන ලබාගන්නා සිසු පිරිස සිය ගණනක් වූ නිසා ඒ අය කවුරුන්ද යන්න තවදුරටත් ප්‍රවෘත්තියක් නොවීය. කුමන පාසලේ සිසුන් වැඩිපුර විශිෂ්ඨ සම්මාන අට බැගින් ලබා ගත්තාද යන අළුත් තරගය බවට පෙරළුණි.

අධ්‍යාපන මට්ටම කෙතරම් ඉහල ගොස් ද යත්, සියළුම විෂයයන්ට විශිෂ්ඨ සම්මාන ලබා විශ්ව විද්‍යාලයට යාමට වරම් නොලබන සිසුන් ද අද ලංකාවේ ඇත.

අප අතර ඇති සාමාන්‍ය පිළිගැනීම වනුයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැඩි ලෙස තරගකාරී වුවද, පොදු ඕස්ට්‍රේලියානුවෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දී තරගකාරී නොවෙති ය යන්නය. එසේ වතුදු, නව දකුණු වේල්සය තුල අධ්‍යාපන ක්ෂේත්‍රයේ තරගකාරී බව ඇති කරන්නට සාධකවන විවිධ වැඩ සටහන් රැසක් ප්‍රාන්ත රජයේ අනුග්‍රහයෙන් පැවැත්වෙන බව කිව යුතුය.

තම පාසල් දිවිය අති තරගකාරී පරිසරයක ගතකොට මෙරටට සංක්‍රමණය කර සිටින, දකුණු දිග සහ ගිණිකොණ දිග ආසියාතියයින් ගේ තමන් හැදුණු වැඩුණු ගම, රට, පරිසරය පිළිබඳ ඇති සංකාව මෙමගින් තරමක් නිවෙන්නාක් සේ පෙනේ. ඒ අප කුඩා කළ ලද තරගකාරී අත්දැකීම් රාශිය අඩු වැඩි අයුරින් අපේ දරුවන්ට ද ලබා දීමේ අවස්ථාව අපට ලැබෙන නිසාය. අප මෙරටට සංක්‍රමණය නොකර ලංකාවේ ම සිටියා නම් පාසලක පලමු වසරට දරුවන් ඇතුලත් කිරීම වනාහි අපේ ජීවිතවලට අති මහත් ආතතියක් ගෙන දෙන ක්‍රියාවලියක් වනු ඇත. අද අපට කරන්නට ඇත්තේ නිවසට නුදුරින්ම පිහිටි පාසලට දරුවා යැවීමයි. ඒ පහසුව අමතක කර දමන අපේ සමහරු, එකම ආකාරයේ සම්පත් ඇති, රජයේ පාසල් අතර කුඩා හෝ වෙනස්කම් සොයා ඒ මගින් ඇතැම් පාසල් වෙනත් පාසල්වලට වඩා සුළු වශයෙන් හෝ හොඳැ යැයි, (උදහරණයක් ලෙස, එකම තදසන්න ප්‍රදේශයේම උතුරේ තිබෙන ප්‍රාථමිකය, දකුණේ පාසලට වඩා හොඳය වැනි), සම්මතයන් සදගන්නට උත්සාහ කරණ අයුරු අපට දැකිය හැකිය. මෙවැනි කරුණු මත පදනම්ව සිය පදිංචිය වෙනස් කරන්නෝ ද බොහෝ සිටිති. ඉන් ඔබ්බට ගොස් ශ්‍රී ලංකාවට ම ආවේණික වූ වංචාවක් සිදුකරමින්, සිනුවර තදසන්න පෙදෙසක තමන් කැමති ප්‍රාථමික පාසලට දරුවා ඇතුලත් කර ගැනීමේ අවශ්‍යතාවයට පමණක් ඒ අසල තට්ටු නිවසක් මාස හයක කාලයකට බද්දට ගත් යුවලක් ගැන මට පසුගිය ද අසන්නට ලැබුණි.

මා පෙර සඳහන් කළ පණිදි, නව දකුණු වේල්සයේ අද පවතින ප්‍රධාන තරග විභාග තුනකි. ඉන් පළමුවැන්න පැවැත්වෙන්නේ සිසුන් සිව්වැනි ශ්‍රේණියේ සිටියදී, පස්වැන්න සහ හයවැන්න සඳහා අධ්‍යාපන කොට්ටාශයට එකක් බැගින් පිහිටුවා තිබෙන ප්‍රශස්ත අවස්ථා පන්තිය :ධචචදරඑමබසඑහ ඣකී* වලට සිසුන් තෝරා ගැනීමටය. මේ සඳහා ඉදිරිපත්වන්නෝ අඩු වුවද, සීමිත සැපයුම නිසා ඇත්තේ දැඩි තරගකාරීත්වයකි. දකුණු දිග සහ අග්නිදිග ආසියානු දෙමව්පියන් තම දරුවන්ව මේ විභාගය සඳහා සූදනම් කරවන්නේ දෙවන වසරේ පමණ සිටය. ඒ තමන් කුඩා කළ මුහුණ දුන් ශිෂ්‍යත්ව විභාගය යලි සිහිපත් කරගනිමින් ය.

ඉන් පසුව හය වෙනි ශ්‍රේණියේ දී එලැඹෙන්නේ, හත්වැන්නේ සිට උසස් විද්‍යාල අධ්‍යාපනය ඇරඹීම සඳහා අධ්‍යාපනික වශයෙන් හොඳ යැයි වර්ගීකරණය කරණු ලැබ ඇති, රජයේ උසස් විද්‍යාල ී:ැකැප්එසඩැ ෂසටයී"ජයදදක* සඳහා සිසුන් බඳවා ගන්නා තරග විභාගයයි. අධ්‍යාපන දිස්ත්‍රික්කයකට එකක් පමණ ඇති මේ පාසල්වල එක් වසරක සිසුන් සඳහා පන්ති කිහිපයක්ම පැවැත්වෙන නිසා තරගය පෙර ප්‍රශස්ත පන්තිය සඳහා වූ තරගයට වඩා අඩුවිය යුතු වුවද, මේ තරග විභාගය සඳහා සිව්වැන්නේ විභාගයට වඩා වැඩි පිරිසක් පෙනී සිටින නිසා, මෙහි ඇතිවන තරගකාරීත්වය පෙරසේ ම තීව්‍රය. එය වඩාත් දරුණු වන්නේ මේ තෝරාගත් පාසල් අතරින් ද එකක් අනිකට වඩා හොඳ යැයි අප විසින්ම ඇති කරගෙන ඇති නිර්ණායකයන් නිසාය.

මේ විභාගයෙන් තෝරාගත් වර්ගයේ විදුහලකට තම දරුවා ඇතුලත් කර ගැනීමට නොහැකිවන දෙමව්පියන්, ඒ බව දැනගත් වහාම, තමන්ගේ ම නිර්ණායක අනුව ඊලගට හොඳ යැයි සම්මත කරගෙන ඇති උසස් විදුහල් පිහිටි තදසන්න ප්‍රදේශවල තාවකාලිකව හෝ පදිංචියට යනු දැක ගත හැකිය.

සිනුවර උසස් විදුහල් අධ්‍යාපන තරගය පිළිබඳ විස්තර දෙසැම්බර් මාසයේ දී බලාපොරොත්තු වන්න.

සිනුවර ආරච්චිල
<sinuwara.arachchila@gmail.com>

3 වන පිටෙන්

එපිට නීතියක් නැත. කිනම් නීතියක් ගෙනවද එහි බලපෑමක් අයිතිකාරයින්ට නැත. සියල්ලට යටත් වන්නේ ඔවුන් යටතේ සිටින්නට පමණි.

රටේ මහතැනින් පටන් ගන්නා මේ වැඩවසම් මානසික තත්ත්වය දැන් ඉන් පහළටද පේරණය වී ඇත. එහි ආසන්නතම සිද්ධිය මර්වින් සිල්වා විසින් සමුද්ධි නිලධාරීයෙකු ගස් බැඳීමයි. අපි හිතමු සමුද්ධි නිළධාරියා වැරදියි කියා. ඔහු එම ඩෙංගු මර්ධන වැඩසටහන සහභාගී නොවීම සේවය පැහැර හැරීමක් කියා. එසේනම් එවැනි

***<u>ඔවුන්ට හිතුණු විටෙක විවිධ බදු පනවති. ඒවා ජනයා වෙත කරනු ලබන ආර්ථික පීඩනය ගැන ඔවුන්ට ප්‍රශ්ණයක් නැත.</u>***

සේවය පැහැර හරින රජයේ සේවකයන් සම්බන්ධව ක්‍රියාකිරීම නිෂ්චිත පිළිවෙතක් ඇත. නමුත් සිදුවුයේ කුමක්ද? අර වැඩවසම් යුගයේදී වහලෙකු සේවය පැහැර හැරි අවස්ථාවකදී ක්‍රියාත්මක වන ආකාරයකි. එය හරියටම කිසිඳු වගවිභාගයකින් තොරව ගම්මුලාදෑනියා ගේ අණට ඔහුව දඬුකඳේ ගැසීම වැනි ක්‍රමයකි. ගම්මුලාදෑනීන්ටද තිබුණේද ගම හිමිකාරීත්වය පිළිබඳ හැඟීමකි. ඔවුන් සිතා සිටියේ ගමේ ඕනෑම දෙයක් තමන්ට ඕන ඕන ආකාරයට නැටවිය හැකි කියාය. එවැනි වූ පාලන ක්‍රම අතහැර වර්ථමානය දක්වා විකාශණය වූයේ මානව වර්ගයාගේ සමාජීය සහ දේශපාලනික අයිතීන් සුරක්ෂිත කිරීම සඳහාය.

දැන් අප නැවත ගමන් කරමින් සිටින්නේ ඉහත පැවති වැඩවසම් ක්‍රමයටය. අයිතිකාරයන් විට ජනයාගේ නිදහස පිළිබඳ හැඟීමක් නැත. ඔවුන්ට යන එන තැන් තීරණය කරන්නේ කනබොන ආකාරය තීරණය කරන්නේ ඔවුන් විසිනි. ඔවුන්ට හිතුණු විටෙක විවිධ බදු පනවති. ඒවා ජනයා වෙත කරනු ලබන ආර්ථික පීඩනය ගැන ඔවුන්ට ප්‍රශ්ණයක් නැත. ඔවුන්ට එය වැඩක්ද නැත. හදිස්සියේ හෝ ඔවුන් විසින් ගෙනන ඒවාට විරුද්ධව ජනයා එක්රැස් වූවහොත් කරන්නේ දැවැන්ත මර්දනයක් ඒ වෙතට මුදා හැරීමයි. මර්දනයෙන් හෝ කුමන හෝ මාර්ගයකින් එම නැගිටීම පාගා දමයි. එවැනි ජන නැගිටීම් අයිතිකාරයින් සිතන්නේ ඒවා තමන්ට එරෙහිව සිදුකෙරන කුමණ්ත්‍රන ලෙසයි.

මේ අයිතිකරුවන් බුද්ධාගම විකුණන තරමට ඔවුන් ධර්මානුකූලව රාජ්‍ය පාලනය කරයිනම් ඔවුන්ට මේ මමත්වය හෙවත් මාගේය යන ආර්ත්මාථකාමී පාලනයක් ගෙන යෑමට නොහැක. මේ මාගේ රට නොව මේ අපගේ රටය. අප සැමගේ රටය. ජනතාවක් ලෙස අප කුළල් කා ගනිමින් ඉන්නතාක් මේ පාලකයන් ලෙස පත්වන්න අයිතිකරුවන්ගේ චරිත රඟපානු ඇත. එසේ නම් තවත් පිල්බෙදී එකෙක්ට එකෙක් නොමැතිව වහල්ව ජීවිත්වනවාද එක්සත්ව නැගීසිට නිදහස්ව, නිවහල්ව ජීවත්වනවාද යන්න ඔබම තීරණය කරන්නට කාලය පැමිණ ඇත.

Experienced Teacher

offers science tuition
for year 7 to year 10.

Contact :
**Sriya on 0413 444 908**

